# විස්තීර්ණ ආර්ථික සහයෝගීතා ගිවිසුම (CEPA) සහ ශ්‍රී ලංකා ආර්ථිකය

එච්.පී. ඩිලානි සංදීපනී, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
92dilanisandeepani@gmail.com

කේ.ඩී.එච්.යූ. ගුණසේකර, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
helanigunasekara@hotmail.com

**සංක්ෂේපය**

ලෝකයේ අද වන විට පවතින රටවල් 200 කින් 161 පමණ ජාත්‍යන්තර වෙළෙඳ සංගමය වැනි අධිජාතීය සංවිධාන යටතේ තම වෙළෙඳාම, ගෝලීය සැපයුම් ජාලයට සම්බන්ධ කරමින් සිටී. වර්තමානය වන විට මෙම ගෝලීය සැපයුම් ජාලයේ ඇතිවන ගැටළු, කලාපීය මට්ටමින් ඇතිකර ගන්නා ගිවිසුම් මත විසඳීමට උත්සාහ කරනු ලැබේ. විස්තීර්ණ ආර්ථික සහයෝගීතාවක අරමුණ වන්නේ ද එය යි. ඒ අනුව ජාත්‍යන්තර වෙළෙඳාම යනු කුමක් ද යන්නත්, ශ්‍රී ලංකාව මෑතකාලීනව එළඹ ඇති වරණීය ගිවිසුම්වල සාර්ථක අසාර්ථකභාවය පිළිබඳවත් "සීපා" ගිවිසුම පිළිබඳවත්, ඉන් ශ්‍රී ලාංකික ආර්ථිකයට සිදුවන බලපෑම පිළිබඳවත් අධ්‍යයනය කිරීම අරමුණ වේ. මේ සඳහා සඟරා, පොත්පත්, අන්තර්ජාල තොරතුරු වැනි ද්විතියික දත්ත මූලාශ්‍ර යොදා ගැනුණි. මෙහි දී මෙම ගිවිසුම තුළින් විවිධ ප්‍රතිලාභ හා පිරිවැය තත්ත්වයන් ඇති වේ.

**මුඛ්‍ය පද**: ජාත්‍යන්තර වෙළෙඳාම, ආනයන, අපනයන, සේවා වෙළෙඳාම

## හැඳින්වීම

ලොව පුරා සෑම රටක් ම පාහේ මුහුණ දෙනු ලබන "හිඟකම" නම් පොදු ගැටළුවට විසඳුම් සෙවීම මඟින් සෑම රටක ම ජීවත්වන මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනා සංතෘප්ත කිරීමට හැකියාව ලැබේ. මෙහි දී ලොව සෑම ආර්ථිකයක් විසින් ම තමා සතු සීමිත සම්පත් යොදා ගනිමින් ඒ ඒ රටට වඩාත් ම වාසිදායක භාණ්ඩය නිපද වූ අතර, ඉන් අතිරික්තයක් අනෙක් රටවල් සමඟ හුවමාරු කරගනු ලැබීම මඟින් ජ්‍යාතන්තර වෙළෙඳාමට අවතීර්ණ වී ඒ තුළින් තම රටෙහි ආර්ථිකය වර්ධනය කිරීමට ප්‍රයත්න දරයි. 1977 දී ශ්‍රී ලංකාව තුළ විවෘත වෙළෙඳ ප්‍රතිපත්තිය ඇති කිරීමත් සමඟින් ශ්‍රී ලංකා ආර්ථිකය ද ජ්‍යාතන්තර වෙළෙඳාම හා නෛතිකව එක්වීම සිදුවිය. ඉන් පසුව ශ්‍රී ලංකාව ලෝකයේ විවිධ රටවල් සමඟ වෙළෙඳ ගිවිසුම්වලට එළඹි අතර, 1975 දී ඇතිකරගත් ආසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (AsiaPacific Trade Agreement- APTA ), 1998 දී ඇතිකරගත් ඉන්දු- ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (India-Sri Lanka Free Trade Agreement-ISFTA) එවැනි ගිවිසුම්වලට උදාහරණ වේ. 1998 දී අත්සන් තැබූ ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ඇතුළත් භාණ්ඩ හුවමාරුවට අමතරව සේවා හුවමාරුවත් තවත් ක්ෂේත්‍රයන් කිහිපයක් ආවරණය වන පරිදි ශ්‍රී ලංකාව, ඉන්දියාව අතර නව විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. සීපා නැතහොත් ඉන්දු-ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (Comprehensive Economic Partnership Agreement-CEPA) නමින් හැඳින්වෙන එය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය උදෙසා කෙතරම් දුරට දායකත්වයක් ලබාදෙනු ඇත්දැයි වර්තමානය වනවිට

ඉතා පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වන කරුණක් බවට පත්ව ඇත. ඒ නිසාවෙන් මෙම කරුණු සියල්ල පාදක කර ගනිමින් සීපා ගිවිසුම පිළිබඳ තවදුරටත් විශ්ලේෂණය කළ හැකි ය.

**අන්තර්ජාතික වෙළෙඳාම හඳුනාගැනීම**

අන්තර්ජාතික වෙළෙඳාම යනු කුමක්දැයි නිර්වචනය කිරීමේ දී එය පොදුවේ භාණ්ඩ, සේවා හා ප්‍රාග්ධනය රටවල් අතර දේශ සීමා බාධකවලින් තොරව හුවමාරු වීම යැයි දැක්විය හැකි ය. වැස(ර්)මන් හා හෝල්ට්මන් (Wasserman & Haltman) ජාත්‍යන්තර වෙළෙඳාම තුළ විවිධ රටවල, විවිධ ජාතීන්ගේ, විවිධ ගනුදෙනු සිදුවේ යන්න දක්වා තිබේ. එමෙන් ම ඇනටෝල් මැරාඩ් (Anatol Marad) ට අනුව ජාත්‍යන්තර වෙළෙඳාම යනු ජාතීන් අතර වෙළෙඳාම යි. ඒඩ්ජ්වර්ත් (Eugeworth) ද ඉහත සඳහන් අදහස ම දරා ඇත (www.wto.org). තම රටවල දළ දේශීය නිෂ්පාදිතයෙන් වැදගත් කොටසක් ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා යෙදවීමට රටවල් වර්තමානය වන විට නැඹුරු වී ඇත. ලොව රටවල් 200 ක් පමණ ඇති අතර, වර්තමානයේ ඒ සියලු ම රටවල් ''ගෝලීයකරණ'' සංකල්පය අනුගමනය කරමින් ජාත්‍යන්තර වෙළෙඳාමට නැඹුරු වී ඇත.

මෙම ජාත්‍යන්තර වෙළෙඳාම සිදු වූ ආකාරය පිළිබඳව සරලව විස්තර කිරීමේ දී, එක් රටක් තම සම්පත් යොදා ගනිමින් වඩාත් ම වාසිදායක භාණ්ඩය නිපද වූ අතර, ඉන් අතිරික්තයක් අනෙක් රටවල් සමඟ හුවමාරු කරගනු ලැබුවේ තම රටට නිපදවීමට අවාසිදායක භාණ්ඩය ආනයනය කරමිනි. කාර්මීකරණය, දියුණු ප්‍රවාහන ක්‍රම, ගෝලීයකරණය, බහුජාතික සමාගම් වැනි කරුණු ජාත්‍යන්තර වෙළෙඳාමේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපෑම් කළ සාධක විය. කෙසේ නමුත් ගෝලීයකරණය හා ජාත්‍යන්තර වෙළෙඳාම අතර පවතින්නේ අනුලෝම සම්බන්ධයකි.

ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පවතින න්‍යායාත්මක පදනම විමසා බැලීමේ දී, 17 වන හා 18 වන සියවස්වල බැංකුකරුවන් හා දාර්ශනිකයන් වැනි පිරිස් අතර ක්‍රියාත්මක වූ වාණිජවාදී අදහස්, නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියට එරෙහිව ඉදිරිපත් වූ අදහස් විය. ඉන් සරලව ප්‍රකාශ වූයේ රජය ගෙවුම් ශේෂ අතිරික්තයක් පවත්වා ගැනීම සඳහා වෙළෙඳාම නියාමනය කළ යුතු බවයි. එහි දී තීරුබදු, කෝටා වැනි වෙළෙඳ බාධක පනවමින් ආරක්ෂණවාදය දියුණු කරනු ලැබී ය. ඉන්පසු වාණිජවාදී අදහස් විවේචනයට ලක් කරමින් 1776 දී ඇඩම් ස්මිත් "නිරපේක්ෂ වාසි න්‍යාය" හඳුන්වා දෙමින් ශ්‍රම විභජනය මත ඇතිවන නිරපේක්ෂ වාසි ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රතිලාභ තීරණය කරන බව ප්‍රකාශ කළේ ය. නිරපේක්ෂ වාසි හෝ අවාසි එකම රටකට පවතින අවස්ථාවේ ජාත්‍යන්තර වෙළෙඳාම සිදුවන්නේ කවර පදනමක් මතදැයි සලකමින් 1819 දී ඩේවිඩ් රිකාඩෝ "දේශපාලන ආර්ථික මූලධර්ම" (The Principle of political Economy) නම් ග්‍රන්ථයේ ජාත්‍යන්තර වෙළෙඳාම සාපේක්ෂ වාසි මත තීරණය වන බව ප්‍රකාශ කරයි. සාපේක්ෂ වාසි න්‍යාය ''ආවස්ථික පිරිවැය'' මත විග්‍රහ කරනුයේ, 1636 දී ගොඩ්ෆ්‍රයිඩ් හාර්බලර් (Godfried Hrberler) විසිනි. හෙක්ෂර්-ඕලින් (Hecksher Ohlin) නැමැත්තවුන් විසින් තවදුරටත් මෙම සාපේක්ෂ වාසි න්‍යාය විස්තර කර ඇත.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම උදෙසා දීර්ඝ ඉතිහාසයක් තිබුණ ද ජාත්‍යන්තර වෙළෙඳාම අර්ථාන්විත ලෙස ව්‍යාප්ත වන්නේ 1977 දී ශ්‍රී ලංකාවේ රජය විසින් විවෘත ප්‍රතිපත්තිය ඇති කිරීමත් සමගිනි.

**ශ්‍රී ලංකාව හා වරණීය වෙළෙඳාම**

නියාමනහරණය (Deregulation) හා ලිබරල්වාදය (Liberalization) පසුගිය දශක කිහිපයක පටන් ලොව වෙළෙඳ රටාව සැකසූ කරුණු විය. එහි දී ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රතිලාභ තීරණය කරනු ලබන්නේ ආනයන වියදම් හා අපනයන අදායම් මත යි. එනම් එය ශුද්ධ අපනයන ලෙස හඳුන්වන අතර, එය රටක ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම නියෝජනය කරයි. නමුත් මෙම ශුද්ධ අපනයන අගය සෑම විට ම ඍණ අගයක් ගැනීම සංවර්ධනය වෙමින් පවතින රටවල සාමාන්‍ය ස්වභාවය වී තිබේ. ශ්‍රී ලංකාව ගත් විට 2013 වර්ෂයට වඩා 2014 වර්ෂයේ දී 6.96% ක වේගයකින් අපනයන ආදායම වර්ධනය වී ඇති අතර, එහි අගය ඇ. ඩොලර් මිලියන 11,118 කි. ශ්‍රී ලංකාවේ මෙම අපනයන අදායමෙන් 44%ක් ඇඟලුම් අපනයන නියෝජනය කරනු ලබන අතර, 19% තේ අපනයන නියෝජනය කරයි. නමුත් මෙම අපනයන ආදායමෙහි යම් වර්ධනයක් පෙන්නුම් කළ ද, අන්තර්ජාතික වෙළෙඳාම තුළින් ලබන ප්‍රතිලාභ අපනයන ආදායම මත ම පමණක් නොව, ආනයන වියදම් මත ද පදනම් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආනයන වියදම 12.59% කින් 2014 වර්ෂයේ වැඩි වී ඇති අතර, ඒ තුළින් වෙළෙඳ හිඟය 21.32% කින් 2014 වර්ෂය වන විට වැඩි වී ඇත (International Monetary Fund- Performances of 2014). මෙලෙස සෑම විට ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ගෙවුම් ශේෂ හිඟයකට මුහුණ දෙමින් සිටින විට, ඒ සඳහා විසඳුමක් ලෙස වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම සාර්ථක වේ. වෙළෙඳ ගිවිසුමක් ද්වි පාර්ශවීය හෝ බහු පාර්ශවීය විය හැකි ය.

1975 ට පෙර වරණාත්මක ගිවිසුම් සඳහා ශ්‍රී ලංකාව එළඹිය ද, මූලික වශයෙන් වරණාත්මක වෙළෙඳ ප්‍රවේශයක් ශ්‍රී ලංකාව ස්වකීය විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය තුළට අන්තර්ගත කරනු ලැබුවේ 1995 න් පසුව ය. ශ්‍රී ලංකාව විසින් එළඹුණු වරණාත්මක වෙළෙඳ ගිවිසුම් හතරක් දැනට ක්‍රියාවට නංවමින් ඇති අතර, ප්‍රධාන වශයෙන් වෙළෙඳ ගිවිසුම් දෙකක් සාකච්ඡා මට්ටමින් තිබේ.

ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන වෙළෙඳ ගිවිසුම් දෙස අවධානය යොමු කිරීමේ දී ආසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (Asia Pacific Trade Agreement- APTA). එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් 1975 දී ඇතිකර ගත්තකි. මෙම ගිවිසුම ආසියා හා ශාන්තිකර කලාපයේ වෙළෙඳාම නිර්බාධකරණය කිරීම හා ව්‍යාප්ත කිරීමේ අරමුණින් ඇතිකර ගත් පැරණිතම වෙළෙඳ ගිවිසුම යි. නමුත් සාමාජිකයන් අතර සිදුවන වෙළෙඳාමේ ප්‍රමාණය ඉතා කුඩා වීමත්, ගිවිසුමෙන් ආවරණය වන භාණ්ඩ ප්‍රමාණය අල්ප වීමත්, රටවල් හතකට පමණක් සීමා වීමත් මෙම ගිවිසුමෙහි සාර්ථකත්වය පිළිබඳව අභියෝග ඇති කරයි.

දකුණු ආසියානු කලාපයේ ක්‍රියාත්මක වන සියලු ම රටවල් එනම් ඉන්දියාව, ශ්‍රී ලංකාව, බංගලාදේශය, පකිස්ථානය, භූතානය හා නේපාලය යන රටවල සහභාගීත්වයෙන් 1985 දී කලාපීය සහයෝගීතාව පිළිබඳ දකුණු ආසියාතික සංගමය (South Asian Association for Region Cooperation - SAARC) පිහිටුවා ගන්නා ලදී. මේ මගින් "සාර්ක්" වරණාත්මක

වෙළෙඳ ගිවිසුම පිහිටුවා ගත්ත ද, මෙමඟින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගත නොහැකි විය. 2006 ජූනි මස දකුණු ආසියාතික නිදහස් වෙළඳ ගිවිසුම (South Asia Free Trade Agreement - SAFTA) නිර්මාණය විය. මෙම ගිවිසුම වඩාත් පුළුල් ලෙස 2012 වසරේ දී බදු රහිත නිෂ්පාදන ආනයන හා අපනයන සඳහා සාමාජික රටවලට ඉඩ ප්‍රස්තාව ලබා දෙනු ලැබිණි (www.wto.org).

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (India-Sri Lanka Free Trade Agreement-ISFTA) පිළිබඳ සාකච්ඡා කිරීමේ දී, 1998 දෙසැම්බර් මස මෙම ගිවිසුම ආරම්භ කිරීමෙන් අනතුරුව 2000 වසරේ සිට ක්‍රියාත්මක විය. 2000 වසරේ දී වසර තුනක් පුරාවට ඉන්දියාව, ශ්‍රී ලංකාවේ අපනයන සම්බන්ධයෙන් එකඟ වූ භාණ්ඩවලට තීරු බදු සහන ලබා දුන් අතර, 2008 පටන් වසර තුනක් පුරාවට ශ්‍රී ලංකාව ඉන්දියාවේ අපනයන සඳහා තීරු බදු ඉවත් කිරීමට යෝජනා විය (www.wto.org). ඇඟළුම් සඳහා ද යම් සීමාසහිත ඒකක ප්‍රමාණයකට තීරු බදු රහිතව අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය. නමුත් එහි ද දුර්වලතා ගණනාවක් විය. පකිස්ථානු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ද පකිස්ථානු ශ්‍රී ලංකා ආර්ථික සම්බන්ධතා ගොඩ නැංවීමේ දී වැදගත් වේ.

**ඉන්දු-ශ්‍රී ලංකා විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම** (Comprehensive Economic Partnership Agreement-CEPA)

1998 දී අත්සන් තැබූ ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම මෙන් ම එය තව දුරටත් පුළුල් කරමින් දෙරටේ ආර්ථික අනුකලන ක්‍රියාවලිය තීව්‍ර කිරීම පිළිබඳව අදහස් හුවමාරු කර ගන්නා ලදී. නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ආවරණය වූයේ දෙරටේ වෙළෙඳ භාණ්ඩ පමණි. භාණ්ඩ හුවමාරුවට අමතරව ඊට වඩා පුළුල් වූ ආර්ථික සහයෝගීතාවක් දෙරට තුළ ම අත්වීමට අවශ්‍ය අනෙකුත් සාධක ද ඇතුළත් වන ලෙස විස්තීරණ ආර්ථික සහයෝගීතාවක් සඳහා වූ ගිවිසුමක් පිළිබඳව 2002 දී ප්‍රථමවරට ඒ පිළිබඳව අධ්‍යනය කොට වාර්තාවක් සැපයීමට දෙරටේ නියෝජිතයන්ගෙන් සමන්විත ඒකාබද්ධ අධ්‍යයන කමිටුවක් පිහිටුවා නිර්දේශ ලබා ගන්න ලදී. දෙරට අතර පවත්නා සමීප භූගෝලීය පිහිටීම හා දේශපාලන සම්බන්ධතා මත ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් ආවරණය වන පරිදි ද්වීපාර්ශවික ආර්ථික අනුකලනය ඉහළ නංවා ගැනීමට මෙම ''සීපා'' ගිවිසුම මඟින් අපේක්ෂිත ය. මෙලෙස ''සීපා'' ගිවිසුම හරහා භාණ්ඩ වෙළෙඳාම ආවරණය වන අතර, එමඟින් රටවල් දෙකෙහි ම නිශේධන ලැයිස්තු අඩු වී, අමතර වෙළෙඳපොළ අවස්ථාවන් උදා කර දීම මෙන් ම, වසර තුනක් ඇතුළත එම නිශේධන ලැයිස්තුවෙන් නිදහස් කළ භාණ්ඩ ආනයනය හෝ අපනයන සඳහා සියලු ම බදු ඉවත් කිරීමටත් යෝජිත ය. සේවා වෙළෙඳාම හරහා අමතර සේවා අංශ විවෘත වේ. එමෙන් ම දෙරට අතර නිදහස් ආයෝජන ගලා යාම් ඇති කිරීම සඳහා මනා ආයතනික සැකැස්මක් තුළින් අවශ්‍ය පරිසරය නිර්මාණය කරයි. තවද නිදහස් ශ්‍රම සංචලනය හරහා ව්‍යවසායකයින් සඳහා විශේෂ අවස්ථාවන් සලසා දේ.

''සීපා'' ගිවිසුම හරහා ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු අතර, දැනට ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ක්‍රියාත්මක වන නිදහස් වෙළෙඳ ගිවිසුම පුළුල් කිරීම, ආයෝජනය ප්‍රවර්ධනය, සේවා අංශය සඳහා ඉඩ ප්‍රස්තාවන් පුළුල් කිරීම හා ආර්ථික ඒකාබද්ධකරණය වැදගත් වේ. අවසානයේ මෙමඟින් දෙරට අතර යටිතල පහසුකම්,

අධ්‍යාපනය, සංචාරක ව්‍යාපාරය, තොරතුරු තාක්ෂණය ආදී ක්ෂේත්‍රවල තාක්ෂණික හා මූල්‍ය සහයෝගීතාව නංවාලීමට ද අදහස් කර ඇත. 2005 සිට 2008 දක්වා කාලය තුළ දෙරටේ නියෝජිතයන් විසින් මෙම ගිවිසුමට අදාළ සියලු පැතිකඩ ආවරණය කරමින් තාක්ෂණික මට්ටමේ සාකච්ඡා 13ක් ද, වෙළෙඳ සාකච්ඡා කමිටුවේ වාර තුනක් ද පවත්වා ගිවිසුම් රාමුව සකසා ගැනීම සිදුකර ඇත. නමුත් තවමත් මෙම ''සීපා'' ගිවිසුම සඳහා ශ්‍රී ලංකාව එකඟත්වය පළ කර නැත. කෙසේ වුවත් "සීපා" වැනි ගිවිසුමක් ඉල්ලුම් කරනු ලැබුවේ ශ්‍රී ලංකාව යි. ''සීපා'' වැනි විස්තීර්ණ ආර්ථික සහයෝගීතා ගිවිසුම් ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාව, ඉන්දියාව අතර පමණක් නොව, එය කොරියාව, ජපානය ඇතුළු බොහෝ රටවල ක්‍රියාත්මක වේ.

''සීපා'' ගිවිසුම ශ්‍රී ලංකාව මෙතෙක් එළඹ ඇති අනෙකුත් ගිවිසුම් තුළින් වෙනස් වන්නේ එය සේවා අංශය ද ආවරණය වන ගිවිසුමක් නිසාවෙනි. රටක ආර්ථික සංවර්ධනය උදෙසා සේවා අංශය කෙතරම් දායකත්වයක් ලබා දෙන්නේ දැයි විමසා බැලීමේ දී, අද වන විට ලොව බොහෝ රටවල් තම ආර්ථිකයේ තෘතීය අංශය කරා නැඹුරු වෙමින් තිබේ. සේවා අංශය යනු මූර්ත වත්කම් බිහි නොකරන අදෘශ්‍යමාන නිෂ්පාදනයන් බිහි කරනු ලබන අංශයකි. එහි නිපදවන නිෂ්පාදන අස්පෘශ්‍ය වේ.

ලෝක ආර්ථිකය තුළ 1995-2014 දක්වා වූ කාලය තුළ වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනයට වඩා රටවල් අවධානය යොමු කර ඇත්තේ සේවා අංශය ආශ්‍රිත නිෂ්පාදන කෙරෙහි ය. සේවා වෙළෙඳාම සම්බන්ධයෙන් වාර්ෂික වර්ධන වේගය අඛණ්ඩව වැඩි වූ අතර, එම වර්ධන වේගය 2009 දී පමණක් ලෝක ආර්ථිකය මුහුණ දුන් මූල්‍ය අර්බුදය හේතුවෙන් සෘණ අගයක් ගත් අතර, ඉන්පසුව නැවත යථා තත්ත්වයට පත් විය. සේවා වෙළෙඳාම සම්බන්ධයෙන් වාර්ෂික වර්ධන වේගය 5% ක් ගනු ලබන අතර, භාණ්ඩ වෙළෙඳාම සම්බන්ධයෙන් එම අගය 0.5% වේ (Highlights WTO, 2015). ලෝක වෙළෙඳාම තුළ සේවා අංශයේ වැඩි නියෝජනයක් දක්වනු ලබන්නේ පරිගණක සේවා වේ. 2014 එම අගය ඇ.එ.ජ. ඩොලර් බිලියන 302 විය. සේවා අපනයන හා ආනයන තුළ ලොව ප්‍රථම ස්ථානය හිමි කරගනිමින් සිටින්නේ ඇමරිකා එක්සත් ජනපදය යි. සමස්ත ලෝක සේවා නිෂ්පාදන අපනයනයෙන් 13.9% (2014), සමස්ත ලෝක සේවා ආනයනයෙන් 9.4% (2014) හිමිකරගෙන සිටී. නමුත් සංවර්ධනය වෙමින් පවතින රටවල්, සමස්ත ලෝක සේවා නිෂ්පාදනයෙන් නියෝජනය කරනු ලබන්නේ 34% පමණි (World Trade Organization Performances, 2014).

වර්තමානයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 57% (2014) සේවා අංශය නිරූපනය කරයි (Kelegama S, 2014). එමෙන් ම 2009 වන විට ශ්‍රී ලංකාව තුළ සේවා අංශය ආශ්‍රිත ව සේවා නියුක්තිය 234,000 පමණ විය. එමෙන් ම ශ්‍රී ලංකාවේ සේවා අංශය නියෝජනය කරනු ලබන මූලික අයිතම වන්නේ, සංචරණය, මූල්‍ය හා තොරතුරු තාක්ෂණය යි. කෙසේ නමුත් අපගේ අපනයන ඉපැයීම් ප්‍රධාන වශයෙන් නුපුහුණු ශ්‍රමිකයන් මත පදනම් ව තිබේ. උගත් සේවා වියුක්තිය ඉහළ අගයක් ගැනීමත්, කාන්තා සේවා වියුක්තිය ඉහළ අගයක් ගැනීමත්, පුහුණු ශ්‍රම වෙළෙඳපොළ සඳහා පිටරටවලින් ශ්‍රමිකයන් ඇදී ඒමත් වැනි හේතූන් නිසා අනෙක් බොහෝ රටවල් විශේෂයෙන් ආසියානු රටවල් වන චීනය, ඉන්දියාව වැනි රටවල් තම ආර්ථිකය සේවා අංශයට නැඹුරු කර ගනිමින් සිටිය ද ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් තවදුරටත් ප්‍රාථමික භාණ්ඩ හා විවිධාංගීකරණය නො වූ, විශාල වශයෙන් විදේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කාර්මික

භාණ්ඩ මත පදනම් ව තිබීමටත් හේතු වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දක්වන දත්ත අනුව ශ්‍රී ලංකා නුපුහුණු ශ්‍රමිකයින් ඉලක්ක කරන ප්‍රධාන වෙළෙඳපොළ වන්නේ, මැදපෙරදිග රටවල් ය. ඒ අනුව විදේශ රටවලට සංචාරය කරන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් 94% පමණ සංචාරය කරන්නේ මැදපෙරදිග රටවලට ය. ඔවුන්ගෙන් 64% ක් නුපුහුණු ශ්‍රමිකයින් වන අතර, 25% පමණක් පුහුණු ශ්‍රමිකයින් වේ. එමෙන් ම උගත් පිරිමි සේවා වියුක්තිය 6.8% ක් වන අතර, උගත් ගැහැණු සේවා වියුක්තිය 14% ක් පමණ වේ (මූලාශ්‍රයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2014). ඒ අනුව ශ්‍රී ලංකාවේ සේවා අංශය තවදුරටත් වර්ධනය කළ යුතු ය. එය වර්ධනය කළ හැකි මට්ටමේ තිබේ. විශේෂයෙන් සංචරණය ආශ්‍රිතව එය වර්ධනය කළ හැකි ය. මේ අනුව ''සීපා'' වැනි ගිවිසුම් හරහා සේවා අංශය ආවරණය වීම වැදගත් ය.

### "සීපා" ගිවිසුම තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිවන බලපෑම

අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ වාර්තා අනුව දක්වන පරිදි 2014 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයනකරුවන්ගෙන්, ඉන්දියාව තුන්වන ස්ථානය ලබා ගත් අතර, දකුණු ආසියාවෙන් ඉන්දියාව පළමු ස්ථානය ලබා ගෙන ඇත. එමෙන් ම 2014 වන විට ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කරනු ලැබූ භාණ්ඩ වෙනුවෙන් අපනයන ඉපැයීම 4.6% සිට 14.85% දක්වා වර්ධනය වී ඇත.

එමෙන් ම ''සීපා'' ගිවිසුම හා එකඟත්වයට පත්වීමෙන් ඉන්දියානු වෙළෙඳපොළ ලාංකික භාණ්ඩ හා සේවාවලට ශක්තිමත් වෙළෙඳපොළක් වනු ඇති බව විශ්වාසය යි. අපගේ රටෙහි ඇති ප්‍රාග්ධන ඌණත්වය වැනි ගැටලු එමඟින් මඟ හරවා ගත හැකි බව විද්වතුන්ගේ අදහස යි. එමෙන් ම භාණ්ඩ වෙළෙඳාම සඳහා ඉන්දියාව ස්වකීය නිශේධන ලැයිස්තුව (Negative List) තවත් අයිතම 114 කින් අඩු කර ගන්නා අතර, ශ්‍රී ලංකාවට අඩු කර ගැනීමට සිදු වන්නේ භාණ්ඩ 32 පමණි. මෙම නිශේධන ලැයිස්තුව යන්නෙහි සරල අර්ථය වන්නේ, අන්තර්ජාතික වෙළෙඳ ගිවිසුමක දී, ගිවිසුමට අදාළ නොවන භාණ්ඩ ලයිස්තුව යි. එමෙන් ම පෙර සඳහන් කළ පරිදි ''සීපා'' ගිවිසුම මූලික වශයෙන් ම අවධානය යොමු කරනු ලබන්නේ සේවා වෙළෙඳාම කෙරෙහි ය. එහි දී ඉන්දියාව මෙම ''සීපා'' ගිවිසුමට අනුව නව උප සේවා අංශ 80 කට ආසන්න ප්‍රමාණයක් ඇරඹීමට බලාපොරොත්තු වන අතර, ශ්‍රී ලංකාවට ඒ සඳහා දායක වීමට තිබෙනුයේ, සේවා අංශ 20 කින් පමණි.

එමෙන් ම ''සීපා'' ගිවිසුමට අත්සන් තැබීම මඟින් ශ්‍රී ලංකාවේ අපනයන සංයුතියෙහි ප්‍රධාන අංශය වන ඇඟළුම් (44%) කර්මාන්තය සඳහා විශේෂ වරණීය තීරු බදු සහන ලබා දීමට ඉන්දියාව අපේක්ෂා කරයි. දැනට පවතින ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම හරහා ඇඟලුම් කොටස් මිලියන 8000 ක් තීරු බදු රහිත ව ඉන්දියාවට අපනයනය කළ හැකි ය. එය තවදුරටත් පුළුල් කරමින් ඇඟලුම් කොටස් මිලියන 3000 ක් තීරු බදු රහිතව ද, ඉතුරු ඇඟලුම් අපනයනවලින් ඉන්දියාවට අපනයන කරනු ලබන ඇඟලුම්වලින් 95% ක් විශේෂ තීරු බදු සහන යටතේ ද අපනයන කිරීමට ඉඩ සලස්වයි.

එමෙන් ම ගිවිසුමෙහි දක්වා ඇති පරිදි මෙම ගිවිසුම මඟින් නිදහස් ශ්‍රම සංචලනයට මඟ පාදයි. එමඟින් ඉන්දියාව අපගේ පුහුණු ශ්‍රමිකයින් සඳහා අසීමිත වූ ගමන් බලපත්‍ර ලබා දේ. එමෙන් ම ශ්‍රී ලංකාවේ දැනට අඩුලුහුඩුකම් ඇති තොරතුරු තාක්ෂණ අංශය,

ගුවන් සේවා වැනි අංශ සඳහා සේවකයින් ලබා දීමට ඉන්දියාව මෙම ගිවිසුම හරහා බලාපොරොත්තු වේ. අවසානයේ ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර මෙලෙස ඇතිවීමට යනු ලබන මෙම ගිවිසුම මගින් ඉන්දියාව නිදහස් වෙළෙඳාමේ සුරක්ෂිතතාව ආරක්ෂා කරයි. එනම් දැනට පවතින තීරු බදු නොවන බාධක ඉවත් කරමින් ශක්තිමත් නිදහස් වෙළෙඳාමකට පිවිසීමට යි. ඒ සඳහා ''සීපා'' ගිවිසුම අන්‍යෝන්‍ය හඳුනාගැනීම (Mutual Recognition) ලෙස කොන්දේසියක් ගිවිසුමෙහි ඇතුළත් කර ඇත.

සීපා ගිවිසුමට එරෙහිව ඇති ප්‍රබල ම විවේචනය වන්නේ, නිදහස් ශ්‍රම සංචලනයට එරෙහිව යි. මෙම ගිවිසුම හරහා ඉතා කුඩා ව්‍යාපාරකයෙකුට වුව ද ශ්‍රී ලංකාවේ ස්වකීය ව්‍යාපාරයන් ඇරඹිය හැකි ය. එහි දී ශ්‍රී ලංකාවට ද එම අවස්ථාව එසේ ම පවතී. නමුත් යථාර්ථවාදී ව සිදුවන්නේ දැඩි සේවා වියුක්තියකින් පෙළෙන ඉන්දියානුවෝ අප රටට ඉතා අවම වැටුප් හා වේතනවලට පැමිණීම යි. ඉන්දියාවේ සේවා වියුක්තිය අප රටෙහි ජනගහනයටත් වඩා විශාල වේ. එය පහත වගුවෙන් හොඳින් පැහැදිලි වේ.

වගුව 1: ඉන්දියාව හා ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා දත්ත


| | ඉන්දියාව (මිලියන) | ශ්‍රී ලංකාව (මිලියන) |
|---|---|---|
| ජනගහනය | 1267 | 20.3 |
| ජනගහන වර්ධන වේගය | 1.25% | 0.86% |
| ශ්‍රමබලකාය | 532 | 8.5 |
| සේවා වියුක්තිය | 37.2 | 0.35 |

මූලාශ්‍රයː ලෝක බැංකුව, 2014

එමෙන් ම ශ්‍රී ලංකාවේ විශාල ඒකාධිපතීත්වයක් ගොඩනගා ගෙන ඇති IOC හා TATA වැනි ආයතන ඉන්දියාව මව් ආයතනය වශයෙන් පවතින බහුජාතික සමාගම් ය. නිදහස් ශ්‍රම සංචලනයක් යටතේ ඉන්දියානු සේවා වියුක්ත ශ්‍රමිකයන්ට එය වාසියක් වනු ඇත.

එමෙන් ම ''සීපා'' ගිවිසුම නොමැති තත්ත්වයක වුව ද අප රටෙහි වර්ධන වේගය සැහීමකට පත්විය හැකි තත්තවයක තිබේ. එය පහත රූප සටහන මගින් මැනවින් පෙනී යයි. ශ්‍රී ලංකාව දැනට 7% වර්ධන වේගයක් පවත්වාගෙන යන අවස්ථාවේ දී ඉන්දියාවෙහි පවත්වාගෙන යන්නේ ඊට වඩා අඩු වර්ධන වේගයකි. එය මැනවින් පහත ප්‍රස්තාරය මගින් විශ්ලේෂණය කළ හැකි ය.

ප්‍රස්තාරය 1 : දළ දේශීය නිෂ්පාදිතය (%) ඉන්දියාව හා ශ්‍රී ලංකාව





මූලාශ්‍රය : අන්තර්ජාතික මූල්‍ය අරමුදල, 2014

එමෙන් ම ඉන්දියානුවන් අපගේ රටෙහි පුහුණු ශ්‍රමිකයින්ට අසීමිතව ගමන් බලපත්‍ර ලබා දීමට ''සීපා'' ගිවිසුම හරහා එකඟ වී ඇත. නමුත් ඔවුන් අපගේ රටෙහි ඇති නීති රෙගුලාසි අනුව ද දැනටමත් ඔවුන් සුරක්ෂිත වී ඇත. නිදසුන් ලෙස වෛද්‍ය වෘත්තීන්වල යෙදෙන්නන් ශ්‍රී ලංකා වෛද්‍ය කවුන්සිලය යටතේ ආරක්ෂාව ලබයි. ශ්‍රී ලංකා නීතිඥයින් ශ්‍රේෂ්ඨාධිකරණය යටතේ ආරක්ෂාව ලබයි. මෙහි දී අවශ්‍ය වන්නේ නුපුහුණු ශ්‍රමිකයින් පිළිබඳව අවධානය යොමු කිරීම යි.

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ඉන්දියාව, ශ්‍රී ලංකාවට වඩා විශාල වශයෙන් ප්‍රතිලාභ ලබාගෙන ඇත. ඒ බව පහත දැක්වෙන්නා වූ ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරයි. ඉන් ඉතා හොඳින් ශ්‍රී ලංකාවට ඉන්දියාව කරනු ලැබූ අපනයන, ශ්‍රී ලංකාව ඉන්දියාවට කරනු ලැබූ අපනයනවලට වඩා බෙහෙවින් වැඩි වී ඇත. එමෙන් ම ගිවිසුම් කාල සීමාවේ ඉන්දියාවට වඩා ශ්‍රී ලංකාව වෙළෙඳ සම්බන්ධතා පවත්වාගෙන ඇත්තේ අනෙකුත් රජයන් සමගිනි.

ප්‍රස්තාරය 2: ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සිදු වූ අපනයන, 2003-2014




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, 2014

**සමාලෝචනය**

භාණ්ඩ සම්බන්ධයෙන් පවතින නිශේධන ලැයිස්තු අඩු වීම, පුහුණු ශ්‍රමිකයින්ට රැකියා අවස්ථා විවර වීම, ඇඟලුම් කර්මාන්තය සඳහා සහනදායී අවස්ථා ලබා දීම, වැනි ප්‍රතිලාභ ''සීපා'' ගිවිසුම හරහා ශ්‍රී ලංකාවට ලැබෙන අතර, ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ට රැකියා අහිමිවීමේ අවදානම, තීරු බදු නොවන බාධක විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වීම වැනි පිරිවැය තත්ත්වයන් ද ''සීපා'' ගිවිසුම හරහා ශ්‍රී ලංකාවට ලැබෙනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Kelagama S., *"The India Sri Lanka Free Trade agreement and the proposed Comprehensive Economic Partnership agreement-A closer Look"*, February 2014, ADBI working paper series.

Thennakoon J. (2015) *"The South Asian Free Trade Agreement Which Way Forward?"*, Journal of South Asian Development

Srilankawatch (2012), *"Ceepa"* http:// srilankawatch. Com /index. php? Option = com _ cont ent&task = view&id=960&Itemid=2, Viewed on 1 November 2015.

Cepaepa, *"What is Ceepa"*, http://www.cepaepa.com/what-is-cepa/, Viewed on 1 November 2015.

IPS, “India Sri Lanka free trade” http://www.ips.lk/staff/ed/publications_ed/international/india_sri_lanka_free_trade_kelegama/india_sri_lanka_free_trade_ips.pdf, Viewed on 28 October 2015.

Sundaytimes, *“Financial Times”*, http://www.sundaytimes.lk/080928/ FinancialTimes/ft332.html, Viewed on 28 October 2015.